රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 09/2020

මගේ අංකය : EST-6/03/LEA/3125
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2020.04.29

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**<u>2020 රාමලාන් (රාමසාන්) සමයේ දී විශේෂ නිවාඩු ලබා දීම</u>**

මෙවර රාමලාන් (රාමසාන්) සමය 2020 අප්‍රේල් 25 දින ආරම්භ වී 2020 මැයි 24 දින අවසන් වීමට නියමිත බැවින් එම කාලසීමාව තුළ දී මුස්ලිම් නිලධරයන්ට යාඥා සහ ආගමික වතාවත්වල නිරත විය හැකි වන පරිදි වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

02. යාඥා සහ ආගමික කටයුතු දිනපතා සිදුකෙරෙන කාලවේලාවන් පහත දැක්වෙන පරිදි වේ.

* පෙරවරු 03.30 සිට පෙරවරු 06.00 දක්වා
* පස්වරු 03.15 සිට පස්වරු 04.15 දක්වා
* පස්වරු 06.00 සිට පස්වරු 07.00 දක්වා
* පස්වරු 07.30 සිට පස්වරු 10.30 දක්වා

03. හැකි සෑම අවස්ථාවකදීම එම නිලධරයන්ට ආගමික වතාවත්වල යෙදීමට හැකිවන පරිදි වැඩමුර සකස් කර දිය යුතු ය. නොවැළැක්විය හැකි අවස්ථාවල දී පමණක් විශේෂ නිවාඩු අනුමත කිරීම මැනවි.

04. අනියම් හෝ ආදේශක පදනම මත සේවය කරන මුස්ලිම් නිලධරයන්ට පමණක්, රාමලාන් (රාමසාන්) අවසන් වීමට දින 14කට කලින් උත්සව අත්තිකාරම් ලබා දීමට ද කරුණාකර කටයුතු කරන්න.

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය